සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
*New Syllabus*

රසායන විද්‍යාව I
இரசாயனவியல் I
Chemistry I

**02 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

* මෙම ප්‍රශ්න පත්‍රය **පිටු 07** කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය ලියන්න.**
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
ප්ලාන්ක්ගේ නියතය $= 6.626 \times 10^{-34}\ J\ s$
ආලෝකයේ ප්‍රවේගය $= 3 \times 10^{8}\ m\ s^{-1}$

1. කාමර උෂ්ණත්වයේදී (25 °C) සහ වායුගෝලීය පීඩනයේදී ($1.0 \times 10^{5}\ N\ m^{-2}$) ද්‍රව අවස්ථාවේ පැවතිය හැකි මූලද්‍රව්‍ය සංඛ්‍යාව වනුයේ,
   (1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

2. C, O, Al, P සහ Ca හි පරමාණුක අරයයන් **වැඩිවන** නිවැරදි අනුපිළිවෙළ වනුයේ,
   (1) O < C < Al < P < Ca
   (2) O < C < P < Al < Ca
   (3) C < O < P < Al < Ca
   (4) C < O < Al < P < Ca
   (5) C < O < Al < Ca < P

3. පහත සඳහන් සංයෝගයේ IUPAC නාමය කුමක් ද?

$$HC{\equiv}C-\overset{\overset{\large O}{\|}}{C}-\overset{\overset{\large CH_3}{|}}{CH}-CH_2OH$$

   (1) 1-hydroxy-2-methylpent-4-yn-3-one
   (2) 2-methyl-3-oxopent-4-yn-1-ol
   (3) 2-methyl-4-pentyn-1-ol-3-one
   (4) 5-hydroxy-4-methylpent-1-yn-3-one
   (5) 5-hydroxy-4-methyl-1-yne-3-pentanone

4. දෙවැනි ආවර්තයේ Li සිට F තෙක් මූලද්‍රව්‍ය පිළිබඳව පහත සඳහන් කුමන ප්‍රකාශය සත්‍ය **නොවේ** ද?
   (1) ඉහළම සෘණ ඉලෙක්ට්‍රෝන බන්ධුතාව පෙන්වන්නේ F ය.
   (2) ඉහළම ධන ඉලෙක්ට්‍රෝන බන්ධුතාව පෙන්වන්නේ Be ය.
   (3) ඉහළම ඔක්සිකරණ අවස්ථාව පෙන්වන්නේ C ය.
   (4) Li සිට F තෙක් පරමාණුක අරයයන් අඩු වේ.
   (5) කැටායන සෑදීමේ හැකියාව සහ ඔක්සිහාරක ලෙස ක්‍රියාකිරීමේ හැකියාව Li සිට F තෙක් අඩු වේ.

5. පරමාණුවක ඇති ඉලෙක්ට්‍රෝනයක අනන්‍යතාව, ක්වොන්ටම් අංක හතරක් ($n,\ l,\ m_l,\ m_s$) යොදා ප්‍රකාශ කළ හැකිය. පහත සඳහන් අංක කුලක අතුරෙන්, පරමාණුවක ඉලෙක්ට්‍රෝනයක් සඳහා ක්වොන්ටම් අංක කුලකයක් ලෙස පිළිගත **නොහැකි** කුමක්දැයි හඳුනාගන්න.
   (1) $\left(4,\ 2,\ 0,\ +\frac{1}{2}\right)$
   (2) $\left(3,\ 1,\ -1,\ +\frac{1}{2}\right)$
   (3) $\left(3,\ 2,\ -3,\ +\frac{1}{2}\right)$
   (4) $\left(2,\ 1,\ 1,\ +\frac{1}{2}\right)$
   (5) $\left(4,\ 0,\ 0,\ -\frac{1}{2}\right)$

www.pastpaperlk.com

6. NSF අණුව පිළිබඳව නිවැරදි තොරතුරු ලබාදෙන්නේ පහත සඳහන් වගුවේ කුමන පේළිය ද?

| | S හි ඔක්සිකරණ අවස්ථාව | S මත ආරෝපණය | S හි මුහුම්කරණය | $N\hat{S}F$ බන්ධන කෝණය | S—F බන්ධනයේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| (1) | −4 | −2 | sp | 180° | S(sp h.o)—F(2p a.o) |
| (2) | −1 | −1 | $sp^2$ | < 120° | S($sp^2$ h.o)—F(2p a.o) |
| (3) | 0 | +1 | $sp^2$ | > 120° | S($sp^2$ h.o)—F(2p a.o) |
| (4) | +1 | 0 | $sp^3$ | 90° | S($sp^3$ h.o)—F(2p a.o) |
| (5) | +4 | 0 | $sp^2$ | 90° − 120° අතර | S($sp^2$ h.o)—F (2p a.o) |

(h.o = මුහුම් කාක්ෂික, a.o = පරමාණුක කාක්ෂික)

7. නයිට්‍රජන්හි වායුමය හයිඩ්‍රයිඩයක් වන $N_aH_b$ (20 $cm^3$ ක්) වැඩිපුර $O_2$ හි දහනය කිරීමෙන් $N_2$ 10 $cm^3$ ක් හා ජලවාෂ්ප 30 $cm^3$ ක් ලබා දුනි. වායුමය හයිඩ්‍රයිඩයේ සූත්‍රය වනුයේ,

(1) $NH_3$ (2) $N_2H_2$ (3) $N_2H_4$ (4) $N_3H$ (5) $N_3H_5$

8. $MCO_3 . 4H_2O$ යන සජල ලෝහ කාබනේටයක 15.6 g ක් තාප වියෝජනයෙන් ලෝහ ඔක්සයිඩය 4.0 g ක් ලබා දේ. M ලෝහයෙහි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය වනුයේ, (H = 1, C = 12, O = 16)

(1) 63.5 (2) 56 (3) 40 (4) 26 (5) 24

9. ද්විධ්‍රැව ඝූර්ණයක් **නොමැති** අණුව තෝරන්න.

(1) $SF_2$ (2) $PCl_4F$ (3) $SF_4$ (4) $PCl_3$ (5) $SF_6$

10. සාන්ද්‍රණය 0.150 mol $dm^{-3}$ වූ $Na_2SO_4$ ද්‍රාවණ 250 $cm^3$ ක් සහ සාන්ද්‍රණය 0.100 mol $dm^{-3}$ වූ NaCl ද්‍රාවණ 750 $cm^3$ ක් මිශ්‍ර කිරීමෙන් ද්‍රාවණයක් සාදා ඇත. මෙම ද්‍රාවණයෙහි සංයුතිය ppm Na ඇසුරෙන්, (O = 16, Na = 23, S = 32, Cl = 35.5)

(1) 3450 (2) 2588 (3) 1725 (4) 3.45 (5) 0.15

11. (A)  (B)  (C)  (D) 

ඉහත සඳහන් සංයෝගවල ආම්ලිකතාව **වැඩිවන** අනුපිළිවෙළ වනුයේ,

(1) **A < D < B < C** (2) **B < C < A < D** (3) **B < C < D < A**
(4) **C < B < A < D** (5) **D < A < B < C**

12. $[Cr(NH_3)_6][Fe(CN)_6]$ හි IUPAC නාමය වනුයේ,

(1) Hexaamminechromium(III)ionhexacyanoferrate(II) ion
(2) Hexaamminechromium(III) hexacyanoferrate(II)
(3) Hexaamminechromium(III)hexacyanoferrate(III)
(4) Hexaamminechromium(III) hexacyanoferrate(III)
(5) Hexaamminechromium(II) hexacyanoferrate(II)

13. $$CH_3 \overset{a}{-} CH_2 \overset{b}{-} C \overset{c}{\equiv} C \overset{d}{-} CH \overset{e}{=} CH_2$$

දී ඇති අණුවේ **a, b, c, d** හා **e** ලෙස නම්කර ඇති බන්ධනවල දිග **වැඩිවන** නිවැරදි අනුපිළිවෙළ දක්වෙන්නේ පහත කුමන සැකසුමෙහි ද?

(1) a < b < d < e < c (2) c < d < e < b < a (3) c < e < d < a < b
(4) c < e < d < b < a (5) d < c < e < b < a

www.pastpaperlk.com

14. A බඳුනෙහි 27 °C හි ඇති හීලියම් වායුව අඩංගු ය. B බඳුනෙහි 127 °C හි ඇති ඔක්සිජන් වායුව අඩංගු ය. A බඳුනෙහි සහ B බඳුනෙහි අඩංගු වායුවල වර්ග මධ්‍යන්‍ය මූල ප්‍රවේගවල අනුපාතය, $\frac{\sqrt{\overline{C_A^2}}}{\sqrt{\overline{C_B^2}}}$ වනුයේ, (He = 4, O = 16)

(1) 0.4    (2) 1.7    (3) 2.4    (4) 4.9    (5) 25

15. (A) $CH_3CH_2CH_2CH_2OH$    (B) $CH_3CH_2CH_2CH_2Cl$
(C) $HOCH_2CH_2CH_2CH_2OH$    (D) $CH_3CH_2CH_2CHO$

ඉහත සඳහන් සංයෝගවල ජලයේ ද්‍රාව්‍යතාව වැඩිවන නිවැරදි අනුපිළිවෙළ දක්වෙන්නේ කුමන සැකසුමෙහි ද?

(1) B < A < D < C    (2) B < C < D < A    (3) B < D < A < C    (4) C < A < D < B    (5) D < B < A < C

16. පහත එක් එක් ද්‍රාවණයෙහි 1.0 $dm^3$ බැගින් මිශ්‍ර කිරීමේදී වැඩිම තාප ප්‍රමාණයක් පිටකරන්නේ කුමන පද්ධතිය ද?

(1) 0.100 mol $dm^{-3}$ HCl සහ 0.200 mol $dm^{-3}$ NaOH
(2) 0.100 mol $dm^{-3}$ $H_2SO_4$ සහ 0.200 mol $dm^{-3}$ NaOH
(3) 0.200 mol $dm^{-3}$ $CH_3COOH$ සහ 0.200 mol $dm^{-3}$ KOH
(4) 0.400 mol $dm^{-3}$ $CH_3COOH$ සහ 0.200 mol $dm^{-3}$ KOH
(5) 0.100 mol $dm^{-3}$ $HNO_3$ සහ 0.200 mol $dm^{-3}$ NaOH

17.



ඉහත සංයෝගය $LiAlH_4$ සමග ප්‍රතික්‍රියා කිරීමෙන් අනතුරුව ප්‍රතික්‍රියා මිශ්‍රණය උදසීනීකරණය කිරීමෙන් ලැබෙන ඵල මොනවා ද?

(1)


සහ



(2)


සහ $CH_3OH$

(3)


, $CH_3OH$ සහ $NH_3$

(4)


සහ $NH_3$

(5)



● **18** සහ **19** ප්‍රශ්න පහත පරිච්ඡේදය මත පදනම් වේ. එම පරිච්ඡේදය සැලකිලිමත්ව කියවා ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

සමහර ලෝහ පෘෂ්ඨ මතට ආලෝකය පතිතවීමෙන්, එයින්, ඉලෙක්ට්‍රෝන නිකුත් විය හැකිය. ආලෝකයෙහි අඩංගු ෆෝටෝන මගින් ගෙනයන ශක්තිය, ලෝහයෙහි ඉලෙක්ට්‍රෝනවලට හුවමාරු වන අතර, ඉලෙක්ට්‍රෝනයක්, එය ධන ආරෝපිත න්‍යෂ්ටියට බැඳී ඇති ආකර්ශන බල අභිබවා යාමට තරම් අවශ්‍ය ශක්තිය ලබාගනී නම්, එයට ප්‍රකාශ ඉලෙක්ට්‍රෝනයක් ලෙස පෘෂ්ඨයෙන් පිටව යා හැකිය. ඉලෙක්ට්‍රෝනයක් පිටව යාමට අවශ්‍ය අවම ශක්තිය ලෝහයෙන් ලෝහයට වෙනස් වෙයි.

18. බේරියම් පෘෂ්ඨයෙන් ප්‍රකාශ ඉලෙක්ට්‍රෝන මුක්තකිරීමට අවශ්‍ය ශක්තිය ඉලෙක්ට්‍රෝන මවුලයකට 240 kJ කි. බේරියම්වලින් ප්‍රකාශ ඉලෙක්ට්‍රෝනයක් ලබාදිය හැකි ආලෝකයෙහි අවම සංඛ්‍යාතය වනුයේ,

(1) $5\times10^{12}\ s^{-1}$    (2) $6\times10^{12}\ s^{-1}$    (3) $2\times10^{14}\ s^{-1}$    (4) $6\times10^{14}\ s^{-1}$    (5) $5\times10^{15}\ s^{-1}$

19. බේරියම්හි මෙම ක්‍රියාවලිය සිදුකළ හැකි ආලෝකයෙහි වැඩිම තරංග ආයාමය වනුයේ,

(1) 450 nm    (2) 480 nm    (3) 500 nm    (4) 530 nm    (5) 550 nm

www.pastpaperlk.com

20. $XeOF_4$ හි අණුක හැඩය සහ ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය පිළිවෙළින්,
(1) ත්‍රියානති ද්විපිරමිඩාකාර සහ අෂ්ටතලීය වේ.
(2) සමචතුරස්‍ර පිරමිඩාකාර සහ ත්‍රියානති ද්විපිරමිඩාකාර වේ.
(3) ත්‍රියානති ද්විපිරමිඩාකාර සහ සමචතුරස්‍ර පිරමිඩාකාර වේ.
(4) සමචතුරස්‍ර පිරමිඩාකාර සහ අෂ්ටතලීය වේ.
(5) අෂ්ටතලීය සහ සමචතුරස්‍ර පිරමිඩාකාර වේ.

21. ආවර්තිතා වගුවෙහි Sc සිට Zn තෙක් මූලද්‍රව්‍ය සහ ඒවායේ සංයෝග පිළිබඳව පහත සඳහන් කුමන වගන්තිය **නිවැරදි** වේ ද?
(1) ඒවාට K සහ Ca වලට වඩා අඩු ඝනත්ව ඇත.
(2) ඒවායින් කිහිපයක් අලෝහ ගුණ පෙන්වයි.
(3) තනුක NaOH එකතුකිරීමේදී $Cr_2O_7^{2-}(aq)$, $CrO_4^{2-}(aq)$ සහ $Cr^{3+}(aq)$ බවට පරිවර්තනය වේ.
(4) ඒවාට, එම ආවර්තයේම *s*-ගොනුවේ මූලද්‍රව්‍යවලට වඩා අඩු විද්‍යුත් සෘණතා ඇත.
(5) Mn ආම්ලික, උභයගුණී සහ භාස්මික ඔක්සයිඩ සාදයි.

22. C(s), S(s) සහ $CS_2(l)$ යන ඒවායේ සම්මත දහන තාප පිළිවෙළින් $-394\ kJ\ mol^{-1}$, $-296\ kJ\ mol^{-1}$ සහ $-1072\ kJ\ mol^{-1}$ වේ. $CS_2(l)$ හි සම්මත උත්පාදන තාපය වනුයේ,
(1) $-86\ kJ\ mol^{-1}$
(2) $86\ kJ\ mol^{-1}$
(3) $382\ kJ\ mol^{-1}$
(4) $-1762\ kJ\ mol^{-1}$
(5) $1762\ kJ\ mol^{-1}$

23. (A) $CH_3CH_2CH{=}CH_2$ (B) $CH_2{=}CH_2$
(C) $CH_2{=}CH{-}CO_2H$ (D) $(CH_3)_2C{=}CH_2$

HBr කෙරෙහි ඉහත සංයෝගවල ප්‍රතික්‍රියාතාව **වැඩිවන** නිවැරදි අනුපිළිවෙළ දක්වෙන්නේ පහත කුමන සැකසුමෙන් ද?
(1) **B < A < C < D**
(2) **B < A < D < C**
(3) **C < B < A < D**
(4) **C < D < B < A**
(5) **D < A < B < C**

24. $CH_3C{\equiv}CH$ සහ $CH_3CH{=}CH_2$ එකිනෙක වෙන්කර හඳුනාගැනීම සඳහා ඇමෝනීය CuCl භාවිත කළ හැක්කේ,
(1) CuCl මගින් $CH_3CH{=}CH_2$ ට වඩා වේගයෙන් $CH_3C{\equiv}CH$ ඔක්සිකරණය වන නිසා ය.
(2) CuCl මගින් $CH_3CH{=}CH_2$ ට වඩා වේගයෙන් $CH_3C{\equiv}CH$ ඔක්සිහරණය වන නිසා ය.
(3) $CH_3C{\equiv}CH$ වලට, $Cu^+$, $Cu^{2+}$ බවට ඔක්සිකරණය කළ හැකි අතර $CH_3CH{=}CH_2$ වලට නොහැකි නිසා ය.
(4) $Cu^+$ මගින් විස්ථාපනය විය හැකි ආම්ලික හයිඩ්‍රජනයක් $CH_3C{\equiv}CH$ හි අඩංගු වුව ද $CH_3CH{=}CH_2$ හි අඩංගු නොවන නිසා ය.
(5) CuCl සමග $CH_3C{\equiv}CH$ ඉලෙක්ට්‍රොෆිලික ආකලන ප්‍රතික්‍රියාවකට භාජනය වන අතර $CH_3CH{=}CH_2$ එසේ නොකරන නිසා ය.

25. 25 °C දී ජලීය සංතෘප්ත $M(OH)_2$ ද්‍රාවණයක pH අගය 10.0 කි. එම උෂ්ණත්වයේදී $M(OH)_2$ වල ද්‍රාව්‍යතා ගුණිතය වනුයේ,
(1) $2.0 \times 10^{-30}\ mol^3\ dm^{-9}$
(2) $4.0 \times 10^{-30}\ mol^3\ dm^{-9}$
(3) $5.0 \times 10^{-13}\ mol^3\ dm^{-9}$
(4) $2.0 \times 10^{-12}\ mol^3\ dm^{-9}$
(5) $4.0 \times 10^{-12}\ mol^3\ dm^{-9}$

26. $NH_2OH$, NO, $NO_2^-$ සහ $NO_3^-$ යන ඒවායේ N—O බන්ධන දුර **අඩුවන** නිවැරදි අනුපිළිවෙළ වනුයේ,
(1) $NO_2^- > NO_3^- > NO > NH_2OH$
(2) $NO_3^- > NO_2^- > NO > NH_2OH$
(3) $NO > NO_2^- > NO_3^- > NH_2OH$
(4) $NH_2OH > NO_3^- > NO_2^- > NO$
(5) $NO > NO_3^- > NO_2^- > NH_2OH$

27. I සහ II කාණ්ඩවල මූලද්‍රව්‍ය (*s* ගොනුවේ මූලද්‍රව්‍ය) සහ ඒවායේ සංයෝග සම්බන්ධයෙන්, පහත සඳහන් කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?
(1) I සහ II කාණ්ඩයේ සියලුම මූලද්‍රව්‍ය සිසිල් ජලය සමග ප්‍රතික්‍රියාකර $H_2$ සහ ඒවායේ ලෝහ හයිඩ්‍රොක්සයිඩ ලබාදෙයි.
(2) රත් කිරීමේදී $LiNO_3$ වියෝජනය වී වායු වශයෙන් $NO_2$ සහ $O_2$ ලබා දෙයි.
(3) කාණ්ඩයේ පහළට යැමේදී II කාණ්ඩයේ සල්ෆේටවල ද්‍රාව්‍යතාව අඩු වේ.
(4) කාණ්ඩයේ පහළට යැමේදී II කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩවල භාස්මික ප්‍රබලතාව අඩු වේ.
(5) II කාණ්ඩයේ මූලද්‍රව්‍යවල කාබනේට රත්කිරීමෙන් ඒවායේ ඔක්සයිඩ ලබාගත හැකිය.

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 4

[ පස්වෙනි පිටුව බලන්න.

28. NaOH නියැදියක් නිෂ්ක්‍රිය අපද්‍රව්‍යයක් සමග මිශ්‍ර වී ඇත. එම NaOH නියැදියෙන් 4.00 g ක් ජලය $1.0\ dm^3$ ක දියකර, ලැබුණු ද්‍රාවණයෙන් $50.0\ cm^3$ ක නියැදියක් $0.10\ mol\ dm^{-3}$ HCl ද්‍රාවණ $50.0\ cm^3$ ක් සමග ප්‍රතික්‍රියා කිරීමට ඉඩ හරින ලදී. ප්‍රතික්‍රියා මිශ්‍රණයෙහි pH 2.0 බව සොයාගන්නා ලදී. NaOH නියැදියෙහි ප්‍රතිශත සංශුද්ධතාව වනුයේ,
(H = 1, O = 16, Na = 23)
(1) 12 (2) 20 (3) 60 (4) 80 (5) 90

29. කාමර උෂ්ණත්වයේදී $Pb(NO_3)_2$ ද්‍රාවණ $100.0\ cm^3$ කට, ප්‍රතික්‍රියාව සම්පූර්ණවන තුරු $0.10\ mol\ dm^{-3}$ HCl ද්‍රාවණයක් සෙමෙන් එකතු කරන ලදී. ලැබෙන ද්‍රාවණය පෙරා, නියත ස්කන්ධයක් ලැබෙන තුරු අවශේෂය වියළා ගන්නා ලදී. වියළි අවශේෂයෙහි ස්කන්ධය 0.139 g ක් විය. $Pb(NO_3)_2$ ද්‍රාවණයෙහි සාන්ද්‍රණය වනුයේ,
(N = 14, O = 16, Cl = 35.5, Pb = 207)
(1) $1.0 \times 10^{-2}\ mol\ dm^{-3}$ (2) $8.4 \times 10^{-3}\ mol\ dm^{-3}$
(3) $5.0 \times 10^{-3}\ mol\ dm^{-3}$ (4) $4.2 \times 10^{-3}\ mol\ dm^{-3}$
(5) $5.0 \times 10^{-4}\ mol\ dm^{-3}$

30. රත්කිරීමේදී භාස්මික වායුවක් ලබා දෙන්නේ පහත සංයෝග අතුරෙන් කුමන සංයෝගය/සංයෝග ද?
(A) $(NH_4)_2CO_3$ (B) $NH_4Cl$ (C) $NH_4NO_2$ (D) $NH_4NO_3$ (E) $(NH_4)_2Cr_2O_7$
(1) A පමණි. (2) B පමණි. (3) E පමණි. (4) A සහ B පමණි. (5) C සහ D පමණි.

● අංක 31 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර හතර අතුරෙන්, එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය/ප්‍රතිචාර කවරේ දැයි තෝරා ගන්න.
(a) සහ (b) පමණක් නිවැරදි නම් (1) මත ද
(b) සහ (c) පමණක් නිවැරදි නම් (2) මත ද
(c) සහ (d) පමණක් නිවැරදි නම් (3) මත ද
(d) සහ (a) පමණක් නිවැරදි නම් (4) මත ද
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද
උත්තර පත්‍රයෙහි දක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

**ඉහත උපදෙස් සම්පිණ්ඩනය**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| (a) සහ (b) පමණක් නිවැරදියි | (b) සහ (c) පමණක් නිවැරදියි | (c) සහ (d) පමණක් නිවැරදියි | (d) සහ (a) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

31. විද්‍යුත් රසායනික ප්‍රතික්‍රියා සහ ඉලෙක්ට්‍රෝඩ විභව පිළිබඳව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?
(a) ඉලෙක්ට්‍රෝඩ විභවය යනු සටනා ගුණයකි.
(b) අර්ධ කෝෂ ප්‍රතික්‍රියා ප්‍රතිවර්ත්‍ය වේ.
(c) සම්මත ඉලෙක්ට්‍රෝඩ විභවයේ ලකුණ (+ හෝ −) පසු ප්‍රතික්‍රියාව සඳහා වෙනස් වේ.
(d) ඉලෙක්ට්‍රෝඩ විභව, උෂ්ණත්වයෙන් ස්වායත්ත වේ.

32. A සංයෝගය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?
(A) $HC{\equiv}C{-}CH_2CH_2CH_2NH_2$
(a) A, $HgCl_2$ හමුවේ තනුක $H_2SO_4$ අම්ලය සමග පිරියම් කළ විට ඇල්ඩිහයිඩයක් ලබාදෙයි.
(b) A, සෝඩියම් සමග ප්‍රතික්‍රියා කළ විට $H_2$ මුක්ත කරයි.
(c) A, $NaNO_2$/ජලීය HCl සමග ප්‍රතික්‍රියා කළ විට $N_2$ මුක්ත කරයි.
(d) A, ජලීය $NaHCO_3$ සමග පිරියම් කළ විට $CO_2$ මුක්ත කරයි.

33. පොලිස්ටයිරීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ්, ෆීනෝල් - ෆෝමැල්ඩිහයිඩ් සහ නයිලෝන් යන බහුඅවයවක සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?
(a) පොලිස්ටයිරීන් සහ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් පමණක් තාපසුවිකාර්ය (thermoplastic) බහුඅවයවක වේ.
(b) පොලිස්ටයිරීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ් සහ නයිලෝන් පමණක් තාපස්ථාපන (thermosetting) බහුඅවයවක වේ.
(c) ෆීනෝල් - ෆෝමැල්ඩිහයිඩ් සහ නයිලෝන් පමණක් සංඝනන බහුඅවයවීකරණය මගින් සාදගැනේ.
(d) පොලිස්ටයිරීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ් සහ නයිලෝන් පමණක් සංඝනන බහුඅවයවීකරණය මගින් සාදගැනේ.

www.pastpaperlk.com
< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 5

34. ස්වාභාවික රබර් සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?
(*a*) ස්වාභාවික රබර්වල සාපේක්ෂ අණුක ස්කන්ධය ආසන්න වශයෙන් 750 000 වේ.
(*b*) ස්වාභාවික රබර්, සල්ෆර් විශාල ප්‍රමාණයක් සමග රත්කිරීමේදී එබනයිට් සෑදේ.
(*c*) ද්විත්ව බන්ධන ඇති බැවින්, ස්වාභාවික රබර්වලට *cis* හා *trans* සමාවයවික තිබිය හැකි වුවත්, ස්වාභාවික රබර්වලට ඇත්තේ *trans* වින්‍යාසයකි.
(*d*) ස්වාභාවික රබර් වල්කනයිස් කිරීමෙන් එහි දෘඪතාව අඩු වේ.

35. සංශුද්ධ, එකිනෙක හා මිශ්‍රවන ද්‍රව දෙකක් මිශ්‍රකර, පරිපූර්ණ ද්‍රාවණයක් සාදාගන්නා ලදී. ඒ පිළිබඳ ව පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?
(*a*) මිශ්‍රවීමේදී එන්තැල්පි වෙනස ශූන්‍ය වේ.
(*b*) ඉහත පරිපූර්ණ ද්‍රාවණයට රවුල් නියමය යෙදිය නොහැකි ය.
(*c*) ද්‍රාවණයේ වාෂ්ප පීඩනය, ද්‍රව දෙකෙහි ආංශික පීඩනවල එකතුවට සමාන වේ.
(*d*) ද්‍රාවණයේ වාෂ්ප පීඩනය, එක් එක් ද්‍රවයෙහි මවුල භාගය සමග රේඛීයව වෙනස් වේ.

36. (A) 

**A** හි එක් ප්‍රතිරූප අවයවයක්,
(*a*) Zn(Hg)/සාන්ද්‍ර HCl සමග පිරියම් කළ විට ලැබෙන ඵලය ප්‍රකාශ සක්‍රියතාව නොදක්වයි.
(*b*) $LiAlH_4$ සමග පිරියම් කළ විට ලැබෙන ඵලය ප්‍රකාශ සක්‍රියතාව නොදක්වයි.
(*c*) ඇමෝනීය $AgNO_3$ සමග පිරියම් කළ විට ලැබෙන ඵලය ප්‍රකාශ සක්‍රියතාව නොදක්වයි.
(*d*) $H_2/Pd$ සමග පිරියම් කළ විට ලැබෙන ඵලය ප්‍රකාශ සක්‍රියතාව නොදක්වයි.

37. **B** සංයෝගය ජලීය NaOH සමග රත්කර ලැබෙන ප්‍රතික්‍රියා මිශ්‍රණය සිසිල්කර උදාසීන කරන ලදී. ප්‍රතික්‍රියා මිශ්‍රණයට බ්‍රෝමීන් දියරය එක් කළ විට එය නිර්වර්ණ විය. මෙම නිරීක්ෂණයට අනුව පහත සඳහන් කුමන සංයෝගය/සංයෝග **B** විය හැකි ද?

(*a*) 
(*b*) 
(*c*) 
(*d*) 

38. සමතුලිත පද්ධති සඳහා පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?
(*a*) රසායනික ප්‍රතික්‍රියාවක සමතුලිතතා නියතයේ ඒකකය, තුලිත රසායනික සමීකරණය මගින් අපෝහනය කළ හැකිය.
(*b*) තාපදායක හා තාපඅවශෝෂක ප්‍රතික්‍රියා දෙවර්ගයේම සමතුලිතතා නියත, උෂ්ණත්වය සමග වෙනස් වේ.
(*c*) විවෘත පද්ධතිවලදී වායු කලාපයේ සහ ද්‍රව කලාපයේ යන දෙකෙහිම රසායනික ප්‍රතික්‍රියාවලට සමතුලිතතාව කරා එළඹිය හැකිය.
(*d*) සමතුලිතතා ප්‍රතික්‍රියාවක්, සමතුලිතතා ප්‍රතික්‍රියා දෙකක හෝ කිහිපයක එකතුවක් ලෙස ලිවිය හැකි නම්, මුළු ප්‍රතික්‍රියාවෙහි සමතුලිතතා නියතය එක් එක් ප්‍රතික්‍රියාවේ සමතුලිතතා නියතවල එකතුව මගින් දෙනු ලැබේ.

39. $NH_3$ සම්බන්ධව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද?
(*a*) $NH_3$ වලට ඔක්සිකාරකයක් මෙන්ම ඔක්සිහාරකයක් ලෙස ද ක්‍රියා කළ හැකිය.
(*b*) මහා පරිමාණයෙන් $NH_3$ නිපදවීමට හේබර් (Haber) ක්‍රමය යොදාගැනීමේදී ඉහළ පීඩන හා ඉහළ උෂ්ණත්ව යටතේ $N_2$ හා $H_2$ භාවිත කෙරෙයි.
(*c*) වැඩිපුර $Cl_2$ වායුව සමග $NH_3$ ප්‍රතික්‍රියා කළ විට $N_2O$ සහ HCl ඵල ලෙස ලැබේ.
(*d*) රබර් කර්මාන්තයේදී රබර් කිරි නිසිකලට පෙර (premature) කැටි ගැසීම වැළැක්වීම සඳහා $NH_3$ භාවිත කෙරෙයි.

40. IA කාණ්ඩයේ මූලද්‍රව්‍ය අතුරෙන්, නයිට්‍රජන් වායුව සමග ප්‍රතික්‍රියා කරන්නේ Li පමණි. පරීක්ෂණයකදී Li 51 g ක්, $N_2$ 39 g ක් සමග ප්‍රතික්‍රියා කිරීමට ඉඩහරින ලදී. පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **සත්‍ය** වේ ද? (Li = 7, N = 14)
(*a*) Li සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කර $N_2$ කොටසක් ඉතිරි වේ.
(*b*) $N_2$ සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා කර Li කොටසක් ඉතිරි වේ.
(*c*) Li වත් $N_2$ වත් සම්පූර්ණයෙන්ම ප්‍රතික්‍රියා නොකරයි.
(*d*) සෛද්ධාන්තිකව, ලැබෙන ඵලයේ ප්‍රමාණය 85 g වේ.

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 6

● අංක **41** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට **හොඳින් ම** ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන පරිදි (1), (2), (3), (4) සහ (5) යන ප්‍රතිචාරවලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය වේ. | සත්‍ය වන අතර, පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහද දෙයි. |
| (2) | සත්‍ය වේ. | සත්‍ය වන නමුත් පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහද **නොදෙයි.** |
| (3) | සත්‍ය වේ. | අසත්‍ය වේ. |
| (4) | අසත්‍ය වේ. | සත්‍ය වේ. |
| (5) | අසත්‍ය වේ. | අසත්‍ය වේ. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 41. | $NH_3$ ලුවිස් භස්මයක් ලෙස ක්‍රියාකරන අතර, $BF_3$ ලුවිස් අම්ලයක් ලෙස ක්‍රියාකරයි. | ලුවිස් භස්මයක් ප්‍රෝටෝන ලබාගන්නා අතර, ලුවිස් අම්ලයක් ප්‍රෝටෝන ප්‍රදානය කරයි. |
| 42. | $NO_2Cl$ වල N−O බන්ධන දෙකෙහි දිග සමාන ය. | $NO_2Cl$ සඳහා පිළිගත හැකි සම්ප්‍රයුක්ත ව්‍යුහ දෙකක් ඇඳිය හැකි ය. |
| 43. | Butanoic අම්ලයේ තාපාංකය, 1-butanol වල තාපාංකයට වඩා වැඩි ය. | 1-butanol වල හයිඩ්‍රජන් බන්ධන නැත. |
| 44. | පරිපූර්ණ ද්‍රාවණයක මිශ්‍රණ එන්තැල්පිය ශුන්‍ය වේ. | පරිපූර්ණ ද්‍රාවණයක, එකිනෙකට වෙනස් අණු වර්ග අතර ආකර්ශන බල සහ එකම වර්ගයේ අණු අතර ආකර්ශන බල සමාන වේ. |
| 45. | Propenal හි කාබන් පරමාණු තුනම එකම සරල රේඛාවක පිහිටයි. | Propenal හි කාබන් පරමාණු තුනම *sp* මුහුම්කරණයට භාජනය වී ඇත. |
| 46. | වාහනවල දුම් බටයේ අගට උත්ප්‍රේරක පරිවර්තක සවිකිරීම මගින් ප්‍රකාශ රසායනික ධූමිකාවලට දායකවීම අඩුකර ගත නොහැකිය. | උත්ප්‍රේරක පරිවර්තකයක, කාබන් මොනොක්සයිඩ් සහ අර්ධ වශයෙන් දැවුණු හයිඩ්‍රොකාබන $CO_2$ බවට ඔක්සිකරණය ද, හයිට්‍රජන් ඔක්සයිඩ $N_2$ බවට ඔක්සිහරණය ද කෙරෙයි. |
| 47. | $N_2O_5(g)$ නියැදියක් රත්කරන විටදී කාලයත් සමඟ පද්ධතියේ සිදුවන පරිමා වෙනස අධ්‍යයනය කිරීමෙන් $2N_2O_5(g) \xrightarrow{\Delta} 4NO_2(g) + O_2(g)$ ප්‍රතික්‍රියාවේ පෙළ නිර්ණය කළ හැකිය. | යම්කිසි ප්‍රතික්‍රියකයට සාපේක්ෂව රසායනික ප්‍රතික්‍රියාවක පෙළ, ප්‍රතික්‍රියකයේ සාන්ද්‍රණය මත රඳා නොපවතී. |
| 48. | මහා පරිමාණයෙන් සල්ෆර් නිපදවීමේදී පෙට්‍රෝලියම් නිධිවල ඇති $H_2S$ භාවිත කෙරෙයි. | විශාල භූගත නිධි, මූලද්‍රව්‍යමය සල්ෆර්වල ප්‍රධාන ප්‍රභව වේ. |
| 49. | ජලීය ද්‍රාවණයකට $Pb(NO_3)_2$ ද්‍රාවණයක් එක් කළ විට කහපැහැ අවක්ෂේපයක් ලැබේ නම්, එළැඹිය හැකි එකම නිගමනය වන්නේ $I^-$ අයන ඇති බවයි. | Pb සාදන, ජලයේ අද්‍රාව්‍ය කහපැහැති එකම සංයෝගය $PbI_2$ වේ. |
| 50. | ඕසෝන් ස්තරය ආරක්ෂාකර ගැනීමට ක්ලෝරොෆ්ලුවොරොකාබන සඳහා විකල්පයක් (alternative) ලෙස හයිඩ්‍රොක්ලෝරොෆ්ලුවොරොකාබන භාවිත කෙරෙයි. | හයිඩ්‍රොක්ලෝරොෆ්ලුවොරොකාබන, ඕසෝන් ස්තරයට හානිදායක නොවේ. |

* * *

www.pastpaperlk.com

53645

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

රසායන විද්‍යාව II
இரசாயனவியல் II
Chemistry II

**02 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ......................................

- ✻ ආවර්තිතා වගුවක් 15 වැනි පිටුවෙහි සපයා ඇත.
- ✻ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ✻ සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ \text{J K}^{-1}\ \text{mol}^{-1}$
- ✻ ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ \text{mol}^{-1}$
- ✻ **මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ඇල්කයිල් කාණ්ඩ සංක්ෂිප්ත ආකාරයකින් නිරූපණය කළ හැකිය.**

උදාහරණ :  කාණ්ඩය $CH_3CH_2$— ලෙස දැක්විය හැකිය.

☐ **A කොටස - ව්‍යුහගත රචනා (පිටු 2 - 7)**

- ✻ **සියලු ම** ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ✻ ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලියන්න. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

☐ **B කොටස සහ C කොටස - රචනා (පිටු 8 - 14)**

- ✻ එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
- ✻ සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස්වලට පිළිතුරු, **A** කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ✻ ප්‍රශ්න පත්‍රයෙහි **B** සහ **C** කොටස් **පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යා හැකිය.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

**අවසාන ලකුණ**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| පරීක්ෂා කළේ 1. | |
| 2. | |
| අධීක්ෂණය | |

www.pastpaperlk.com

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න **හතරට ම** මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත **ලකුණු ප්‍රමාණය** 10 කි.)

මේ තීරයේ කිසිවක් නොලියන්න.

1. (*a*) පහත දක්වෙන ප්‍රශ්නවලට, දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.

(i) භූදෙකලාව පවතින $Fe^{3+}$, $Cr^{3+}$ සහ $Co^{2+}$ යන අයන තුන අතුරෙන් වියුග්ම ඉලෙක්ට්‍රෝන **තුනක්** ඇත්තේ කුමකට ද? ........................

(ii) 3*d* ගොනුවේ Ti, V සහ Cr යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, බන්ධන සෑදීමේදී උපරිම වශයෙන් ඉලෙක්ට්‍රෝන **පහක්** සහභාගි විය හැකි මූලද්‍රව්‍යය කුමක් ද? ........................

(iii) C, N හා Si යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, **අඩුම** විද්‍යුත්සෘණතාව ඇත්තේ කුමකට ද? ........................

(iv) Na, Mg හා Al යන මූලද්‍රව්‍ය තුන අතුරෙන්, **වැඩිම** පළමුවන අයනීකරණ ශක්තිය ඇත්තේ කුමකට ද? ........................

(v) $N^{3-}$, $O^{2-}$ හා $F^{-}$ යන සමඉලෙක්ට්‍රෝනික ඇනායන තුන අතුරෙන්, **විශාලතම** අයනික අරය ඇත්තේ කුමකට ද? ........................

(vi) $Na^{+}$, $Ca^{2+}$ හා $Al^{3+}$ යන කැටායන තුන අතුරෙන්, **කුඩාම** අයනික අරය ඇත්තේ කුමකට ද? ........................

**(ලකුණු 3.0)**

(*b*) ආම්ලිකෘත ජලීය නයිට්‍රයිට ද්‍රාවණ $H_2O_2$ භාවිතයෙන් නයිට්‍රේට බවට ඔක්සිකරණය කිරීමේදී අතරමැදි ඵලයක් ලෙස පෙරොක්සොනයිට්‍රස් අම්ලය (HOONO) සෑදේ. පෙරොක්සොනයිට්‍රයිට අයනය $[OONO]^{-}$ සම්බන්ධයෙන් (i) සිට (vii) තෙක් කොටස් සඳහා පිළිතුරු සපයන්න. එහි සැකිල්ල පහත දී ඇත.

O—O—N—O

(i) මෙම අයනය සඳහා **වඩාත් ම** පිළිගත හැකි ලුවිස් ව්‍යුහය අඳින්න.

(ii) මෙම අයනය සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න. හේතු දක්වමින් ඒවායේ සාපේක්ෂ ස්ථායිතා පිළිබඳව අදහස් දක්වන්න.

(iii) VSEPR වාදය භාවිතකරමින් පහත පරමාණු වටා ඇති හැඩ ව්‍යුත්පන්න කරන්න.

I. N ........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

II. N සහ O යන දෙකටම බැඳුණු O

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................



www.pastpaperlk.com

මේ තීරයේ කිසිවක් නොලියන්න.

(iv) පහත දී ඇති වගුවෙහි,
I. පරමාණු වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය (ඉලෙක්ට්‍රෝන යුගල්වල සැකසුම)
II. පරමාණුවල මුහුම්කරණය
සඳහන් කරන්න.

| | | N | N සහ O යන දෙකටම බැඳුනු O |
|---|---|---|---|
| I. | ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය | | |
| II. | මුහුම්කරණය | | |

(v) ආසන්න බන්ධන කෝණ දක්වමින් ඉහත (i) කොටසෙහි අඳින ලද ලුවිස් ව්‍යුහයේ හැඩය දළ සටහන් කරන්න.

(vi) ඉහත (i) කොටසෙහි අඳින ලද ලුවිස් ව්‍යුහයෙහි පහත දක්වා ඇති බන්ධන සෑදීම සඳහා සහභාගී වන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනාගන්න. පහත දැක්වෙන පරිදි ඔක්සිජන් පරමාණු 1, 2 සහ 3 ලෙස නම් කර ඇත:

$\overset{1}{O}-\overset{2}{O}-N-\overset{3}{O}$

I. $\overset{1}{O}$ සහ $\overset{2}{O}$ ..............................................

II. $\overset{2}{O}$ සහ N ..............................................

(vii) පෙරොක්සිනයිට්‍රස් අම්ලයෙහි සමාවයවිකයක් දෙන්න.

..............................................................................................

(ලකුණු 5.0)

(c) (i) පහත දී ඇති ලැයිස්තුවෙන් ධ්‍රැවීය විශේෂ දෙකක් තෝරන්න.

$H_2CO$ (ෆෝමැල්ඩිහයිඩ්), $SF_6$, COS, $ICl_4^-$, $SiCl_4$ .................... සහ ....................

(ii) පහත දැක්වෙන එක් එක් යුගලයේ අණු අතර පවතින අන්තර්අණුක බල වර්ගය/වර්ග සඳහන් කරන්න.

I. HBr(g) සහ $H_2S(g)$ ..............................................

II. $Cl_2(g)$ සහ $CCl_4(g)$ ..............................................

III. $CH_3OH(l)$ සහ $H_2O(l)$ ..............................................

(ලකුණු 2.0)

100

2. (a) (i) තුන්වන ආවර්තයේ ඇති මූලද්‍රව්‍ය මගින් සෑදෙන ඉහළම ඔක්සිකරණ අවස්ථාව සහිත ඔක්සයිඩවල සූත්‍ර දෙන්න.

පහත ලැයිස්තුව භාවිතයෙන් ඒවායේ ආම්ලික / උභයගුණී / භාෂ්මික ස්වභාවය පිළිබඳ අදහස් දක්වන්න.

ඉතා ප්‍රබල ආම්ලික, ප්‍රබල ආම්ලික, දුබල ආම්ලික, ඉතා දුබල ආම්ලික,
දුබල භාස්මික, භාස්මික, ප්‍රබල භාස්මික, උභයගුණී, උදාසීන

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

www.pastpaperlk.com

මේ තීරයේ කිසිවක් නොලියන්න.

(ii) තුන්වන ආවර්තය හරහා වමේ සිට දකුණට විද්‍යුත්සෘණතාව, පරමාණුක අරය සහ පළමු අයනීකරණ ශක්තිය යන මේවා කෙසේ වෙනස්වේදැයි ප්‍රකාශ කරන්න.

විද්‍යුත්සෘණතාව ..............................

පරමාණුක අරය ..............................

පළමු අයනීකරණ ශක්තිය ..............................

(iii) ලෝහය ලෙස **M** භාවිත කරමින් II කාණ්ඩයේ නයිට්‍රේටවල තාප වියෝජනය සඳහා පොදු ප්‍රතික්‍රියාවක් දෙන්න.

..............................

(iv) II කාණ්ඩයේ නයිට්‍රේට තාප ස්ථායිතාව **වැඩිවන** අනුපිළිවෙළට (< සංකේතය භාවිත කරමින්) සකස් කරන්න. අයනවල ධ්‍රැවීයකරණය අනුසාරයෙන් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

..............................

..............................

..............................

..............................

..............................

(ලකුණු 3.5)

(*b*) පහත දැක්වෙන ප්‍රශ්න Mn යන ආන්තරික මූලද්‍රව්‍ය සහ එහි සංයෝග මත පදනම් වී ඇත.

(i) Mn වල ඉලෙක්ට්‍රෝන වින්‍යාසය දෙන්න.

..............................

(ii) Mn වල සුලබ ඔක්සිකරණ අවස්ථා දක්වන්න.

..............................

(iii) මෙම සුලබ ඔක්සිකරණ තත්ත්වවලදී Mn සාදන ඔක්සයිඩවල රසායනික සූත්‍ර දෙන්න. මෙම එක් එක් ඔක්සයිඩය ආම්ලික ද උභයගුණී ද භාස්මික ද යන වග දක්වන්න.

..............................

..............................

..............................

(iv) $KMnO_4$ සඳහා IUPAC නාමය දෙන්න.

..............................

(v) 3*d* ආන්තරික මූලද්‍රව්‍ය අතුරෙන් Mn වලට අඩුම ද්‍රවාංකය හා අඩුම තාපාංකය ඇත. ඒ ඇයිදැයි විස්තර කරන්න.

..............................

..............................

..............................

(vi) ජලීය $Mn^{2+}$ ද්‍රාවණයකට තනුක ඇමෝනියා ද්‍රාවණයක් එක්කර ඉන්පසු වාතයට නිරාවරණය කිරීමේදී ඔබ නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තුවන්නේ මොනවා ද?

..............................

..............................

www.pastpaperlk.com

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 4

මේ තීරයේ කිසිවක් නොලියන්න.

(vii) ජලීය $KMnO_4$ ද්‍රාවණයකට සාන්ද්‍ර KOH එක්කිරීමේදී කොළපාට විය. එම කොළපාට ද්‍රාවණය ජලය හෝ අම්ල භාවිතකර තනුක කිරීමේදී දම් පැහැති ද්‍රාවණයක් සහ කළු පැහැති දුඹුරු අවක්ෂේපයක් ලැබෙයි. ඔබගේ නිරීක්ෂණ පැහැදිලි කිරීම සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(viii) පහත එක් එක් ඒවායේ **එක්** වැදගත් භාවිතයක් දෙන්න.

I. $KMnO_4$ (ඔක්සිකාරකයක් ලෙස හැර)

..............................................................................................................

..............................................................................................................

II. Mn ලෝහය

..............................................................................................................

(ix) ආම්ලික හා භාස්මික මාධ්‍යවලදී $KMnO_4$ ඔක්සිකාරකයක් ලෙස හැසිරෙන්නේ කෙසේදැයි පෙන්වීමට අර්ධ ප්‍රතික්‍රියා දෙන්න.

ආම්ලික මාධ්‍යය : ..............................................................................................................

භාස්මික මාධ්‍යය : ..............................................................................................................

(x) ඔක්සිකාරකයක් ලෙස $KMnO_4$ භාවිතයේදී ඔබ බලාපොරොත්තුවන ගැටලු **දෙකක්** දක්වන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

100

**(ලකුණු 6.5)**

3. (*a*) *P* පීඩනයෙහිදී සහ *T* උෂ්ණත්වයෙහිදී $O_2(g)$ සහ $O_3(g)$ මිශ්‍රණයක්, පරිමාව *V* වන දෘඪ සංවෘත භාජනයක් තුළ සමතුලිතතාවේ පවතියි.

(i) $n_1, n_2, M_1, M_2$ හා *V* ඇසුරෙන්, වායු මිශ්‍රණයෙහි ඝනත්වය (*d*) ප්‍රකාශ කරන්න.

මෙහි, $n_1$ = $O_2$ මවුල සංඛ්‍යාව  $n_2$ = $O_3$ මවුල සංඛ්‍යාව

$M_1$ = $O_2$ හි මවුලික ස්කන්ධය  $M_2$ = $O_3$ හි මවුලික ස්කන්ධය

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ii) ඉහත සම්බන්ධතාව $X_1, X_2, M_1, M_2$, *V* සහ *n* ඇසුරෙන් ප්‍රකාශ කරන්න.

මෙහි, $X_1$ = $O_2$ හි මවුල භාගය  $X_2$ = $O_3$ හි මවුල භාගය

*n* = වායු දෙකෙහිම මුළු මවුල සංඛ්‍යාව

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

www.pastpaperlk.com



[ හයවෙනි පිටුව බලන්න.

මේ තීරයේ කිසිවක් නොලියන්න.

(iii) එනයින්, $X_1 = \left(3 - \frac{dRT}{16P}\right)$ බව පෙන්වන්න.

මෙහි $R$ යනු සාර්වත්‍ර වායු නියතය වේ. (O හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය = 16)

.................................................................................................................................

(iv) ඉහත පියවරවලදී ඔබ භාවිත කළ උපකල්පනය/උපකල්පන සඳහන් කරන්න.

.................................................................................................................................

(ලකුණු 5.0)

(b) (i) පහත දැක්වෙන සම්මත ඔක්සිහරණ විභව සලකන්න.

$$E^{\ominus}\left[Br_2(l)/Br^-(aq)\right] = 1.07\ V$$

$$E^{\ominus}\left[I_2(s)/I^-(aq)\right] = 0.54\ V$$

I. 1.0 mol $dm^{-3}$ ජලීය KI ද්‍රාවණයකට ද්‍රව බ්‍රෝමීන් එක් කළ විට සිදුවෙතැයි ඔබ අපේක්ෂා කරන ප්‍රතික්‍රියාව කුමක් ද?

.................................................................................................................................

II. ඉහත පරීක්ෂණයේදී ඔබ අපේක්ෂා කරන වර්ණ විපර්යාස ලියා දක්වන්න.

.................................................................................................................................

(ii) පහත සඳහන් විද්‍යුත් රසායනික සමීකරණය සලකන්න.

$$Mg(s) + 2H^+(aq) \longrightarrow Mg^{2+}(aq) + H_2(g)$$

I. ඉහත ප්‍රතික්‍රියාවට අනුකූල වන ගැල්වානීය කෝෂයෙහි කැතෝඩීය ප්‍රතික්‍රියාව ලියන්න.

.................................................................................................................................

II. ඉහත කෝෂය නිරූපණය කිරීම සඳහා සම්මුතික අංකනය (conventional notation), ලවණ සේතුවක් අඩංගු කරමින් ලියා දක්වන්න.

.................................................................................................................................

III. ඉහත කෝෂ ප්‍රතික්‍රියාව ඉදිරියට යන විට එන්ට්‍රෝපිය වැඩිවේ ද, අඩුවේ ද, නැතහොත් නියතව පවතී ද?

.................................................................................................................................

ඔබේ පිළිතුර **සැකෙවින්** පැහැදිලි කරන්න.

.................................................................................................................................

IV. $T$ උෂ්ණත්වයේදී ඉහත ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධව සිදුවීම සඳහා එන්තැල්පි වෙනස (ΔH) සහ එන්ට්‍රෝපි වෙනස (ΔS) අතර තිබිය යුතු සම්බන්ධතාව කුමක් ද?

.................................................................................................................................

(ලකුණු 5.0)

100

www.pastpaperlk.com

මේ තීරයේ කිසිවක් නොලියන්න.

4. (*a*) **A, B** සහ **C** යනු අණුක සූත්‍රය $C_7H_{14}$ වන සමාවයවික හයිඩ්‍රොකාබන තුනකි. **A** සංයෝගය ජ්‍යාමිතික සමාවයවිකතාව පෙන්වන අතර, **B** සහ **C** සංයෝග එය නොපෙන්වයි. සංයෝග තුනම ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි. උත්ප්‍රේරිත හයිඩ්‍රජනීකරණයේදී සංයෝග තුනම, **D** ($C_7H_{16}$) සංයෝගය ලබාදෙයි. **D** සංයෝගය ද ප්‍රකාශ සමාවයවිකතාව පෙන්වයි. **A, B, C** සහ **D** හි ව්‍යුහ දක්වන්න. (ත්‍රිමාන සමාවයවික ආකාර ඇඳීම අවශ්‍ය **නොවේ**.)

**A** **B** **C** **D**

බ්‍රෝමීන් සමඟ පිරියම් කර, ඉන්පසු මද්‍යසාරීය KOH සමඟ හයිඩ්‍රොබ්‍රෝමීන්හරණය කළ විට, **A** සංයෝගය **E** සහ **F** සංයෝග දෙක සාදන අතර, **B** සංයෝගය **G** ද, **C** සංයෝගය **H** ද සාදයි. **E, F, G** සහ **H** යන සංයෝග හතරටම $C_7H_{12}$ යන එකම අණුක සූත්‍රය ඇත. **E** සංයෝගය ජ්‍යාමිතික සමාවයවිකතාව පෙන්වන අතර, **F, G** සහ **H** සංයෝග එය නොපෙන්වයි. **E, F, G** සහ **H** හි ව්‍යුහ දක්වන්න.

**E** **F** **G** **H**

**F** සහ **G** එකිනෙකින් වෙන්කර හඳුනාගැනීම සඳහා **එක්** රසායනික පරීක්ෂාවක් දෙන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

**(ලකුණු 7.0)**

(*b*) අංක 1 සිට 5 තෙක් ඇති එක් එක් ප්‍රතික්‍රියාවෙහි ප්‍රතික්‍රියකය සහ ප්‍රතිකාරකය පහත වගුවෙහි දී ඇත. එම එක් එක් ප්‍රතික්‍රියාව සඳහා ප්‍රතික්‍රියා වර්ගය [න්‍යුක්ලියෝෆිලික ආකලනය ($A_N$), ඉලෙක්ට්‍රොෆිලික ආකලනය ($A_E$), න්‍යුක්ලියෝෆිලික ආදේශය ($S_N$), ඉලෙක්ට්‍රොෆිලික ආදේශය ($S_E$), ඉවත්කිරීම (E)] සහ ප්‍රධාන ඵලය අදාළ කොටු තුළ ලියන්න.

| | ප්‍රතික්‍රියකය | ප්‍රතිකාරකය | ප්‍රතික්‍රියා වර්ගය | ප්‍රධාන ඵලය |
|---|---|---|---|---|
| 1 |  | සාන්ද්‍ර $HNO_3$ / සාන්ද්‍ර $H_2SO_4$ | | |
| 2 | $CH_3CH=CH_2$ | HBr | | |
| 3 | $CH_3CHO$ | $H^+$ / KCN | | |
| 4 | $CH_3CH_2CHBrCH_3$ | මද්‍යසාරීය KOH | | |
| 5 | $CH_3CH_2I$ | ජලීය KCN | | |

**(ලකුණු 3.0)**

100

* *

53934

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

රසායන විද්‍යාව II
இரசாயனவியல் II
Chemistry II

02 S II

✻ සාර්වත්‍ර වායු නියතය, $R = 8.314\ \mathrm{J\ K^{-1}\ mol^{-1}}$
✻ ඇවගාඩ්රෝ නියතය, $N_A = 6.022 \times 10^{23}\ \mathrm{mol^{-1}}$

## B කොටස — රචනා

ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට **ලකුණු 15** බැගින් ලැබේ.)

**5.** (*a*) සංවෘත දෘඪ භාජනයක අන්තර්ගත **A** වායුව පෙන්නුම් කරන පහත සමතුලිතතා සලකන්න.

(i) $T$ (කෙල්වින්) උෂ්ණත්වයකදී පහත ප්‍රතික්‍රියාවට **A** භාජනය වෙයි.

$$2\mathrm{A(g)} \rightleftharpoons \mathrm{B(g)} \qquad (1)$$

සමතුලිතතාවට එළැඹුණු පසු, **A** හි ආරම්භක ප්‍රමාණයෙන් 40% ක් **B** බවට පරිවර්තනය වී ඇති බව ද පද්ධතියෙහි මුළු පීඩනය $4 \times 10^5\ \mathrm{N\ m^{-2}}$ බව ද සොයාගෙන ඇත. $T$ උෂ්ණත්වයේදී මෙම සමතුලිතතාව සඳහා සමතුලිතතා නියතය $K_p$ ගණනය කරන්න.

(ii) පද්ධතියෙහි උෂ්ණත්වය $2T$ (කෙල්වින්) තෙක් වැඩි කළ විට, ඉහත ප්‍රතික්‍රියාවට අමතරව, පහත දක්වෙන පරිදි තවත් ප්‍රතික්‍රියාවකට **A** භාජනය වෙයි.

$$2\mathrm{A(g)} \rightleftharpoons \mathrm{C(g)} + \mathrm{D(g)} \qquad (2)$$

පද්ධතිය $2T$ හිදී සමතුලිතතාවට එළැඹුණු පසු, **A** හි ආරම්භක ප්‍රමාණයෙන් 20% ක් **C** සහ **D** බවට පරිවර්තනය වී ඇති බව ද **A** හි ආරම්භක ප්‍රමාණයෙන් 20% ක් ඉතිරිව ඇති බව ද සොයාගෙන ඇත.

I. **A** හි ආරම්භක මවුල සංඛ්‍යාව $a$ වූයේ නම්, මෙම සමතුලිතතාවෙහිදී **A, B, C** සහ **D** හි මවුල සංඛ්‍යා වෙන වෙනම ගණනය කරන්න.

II. $2T$ හි දී (2) වන සමතුලිතතාව සඳහා සමතුලිතතා නියතය $K_p$ ගණනය කරන්න.

III. $2T$ හි දී (1) වන සමතුලිතතාව සඳහා සමතුලිතතා නියතය $K_p$ ගණනය කරන්න.

(ලකුණු 8.5 යි.)

(*b*) නියත උෂ්ණත්වයකදී, ජලය සහ $n$-බියුටනෝල් කලාප අතර ඇසිටික් අම්ලයෙහි විභාග සංගුණකය නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයෙක් පහත දක්වෙන ක්‍රියාපිළිවෙළ භාවිත කළේය.

1 හා 2 ලෙස අංකනය කරන ලද ප්‍රතිකාරක බෝතල්වලට $n$-බියුටනෝල්, $1.0\ \mathrm{mol\ dm^{-3}}$ ජලීය ඇසිටික් අම්ලය සහ ජලයෙහි විවිධ පරිමා, පහත වගුවෙහි දක්වෙන පරිදි එක් කරන ලදී.

| ප්‍රතිකාරක බෝතලය | $n$-බියුටනෝල් පරිමාව/$\mathrm{cm^3}$ | ජලීය ඇසිටික් අම්ල පරිමාව/$\mathrm{cm^3}$ | ජලය පරිමාව /$\mathrm{cm^3}$ |
|---|---|---|---|
| 1 | 20.00 | 40.00 | 0.00 |
| 2 | 20.00 | 30.00 | 10.00 |

www.pastpaperlk.com

බෝතල් හොඳින් සොලවා, ඉන්පසු එක් එක් පද්ධතිය සමතුලිතතාවට එළැඹීමට ඉඩ හරින ලදී. ස්තර වෙන්වූ පසු, ජලීය ස්තරයෙන් සහ බියුටනෝල් ස්තරයෙන් $10.00\ cm^3$ බැගින් ගෙන, සාන්ද්‍රණය $0.500\ mol\ dm^{-3}$ වූ ප්‍රාමාණික NaOH ද්‍රාවණයක් සමඟ අනුමාපනය කරන ලදී. බෝතල (1) න් ගන්නා ලද ජලීය ස්තරය අනුමාපනය කළවිට අන්ත ලක්ෂ්‍යයෙහිදී ලැබුණු පාඨාංකය පහත වගුවේ දී ඇත.

| ප්‍රතික්‍රියක බෝතලය | ජලීය ස්තරයේ $10.00\ cm^3$ සඳහා අවශ්‍ය වූ NaOH පරිමාව / $cm^3$ | $n$-බියුටනෝල් ස්තරයේ $10.00\ cm^3$ සඳහා අවශ්‍ය වූ NaOH පරිමාව / $cm^3$ |
|---|---|---|
| 1 | 16.00 | $x$ |
| 2 | $y$ | $z$ |

(i) බෝතල (1) හි $n$-බියුටනෝල් ස්තරය සඳහා ලැබිය යුතු අන්ත ලක්ෂ්‍යය $x$ ගණනය කරන්න.

(ii) බෝතල (1) හි පද්ධතිය යොදාගනිමින් ජලය සහ $n$-බියුටනෝල් අතර ඇසිටික් අම්ලයෙහි විභාග සංගුණකය ගණනය කරන්න.

(iii) බෝතල (2) හි පද්ධතිය සඳහා ලැබිය යුතු $y$ සහ $z$ යන පරිමා ගණනය කරන්න.

(iv) ඉහත ගණනය කිරීම්වලදී ඔබ කරන ලද උපකල්පන ප්‍රකාශ කරන්න.

(v) මෙම අනුමාපන සඳහා භාවිත කළ හැකි දර්ශකයක් නම් කරන්න.

(vi) බෝතල් සොලවමින් තිබූ කාලය තුළදී ජලීය ස්තරයෙහි pH අගය වෙනස් විණි දැයි ප්‍රකාශ කරන්න. ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

*(ලකුණු 6.5 යි.)*

6. (*a*) (i) සාන්ද්‍රණය $c\ mol\ dm^{-3}$ වන ජලීය $CH_3COOH$ ද්‍රාවණයක pH සඳහා ප්‍රකාශනයක්, අම්ල විඝටන නියතය $K_a$ සහ $c$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

(ii) ඉහත ව්‍යුත්පන්න කිරීමේදී ඔබ කරන ලද උපකල්පන ලියන්න.

(iii) ඉහත අම්ල ද්‍රාවණයෙහි $100.0\ cm^3$ ක තියැදියක්, ආසුත ජලය එකතුකිරීමෙන් $1.00\ dm^3$ තෙක් තනුක කරන ලදී. ඉහත (i) කොටසෙහි ලබාගත් ප්‍රකාශනය ආධාරයෙන්, මෙම අම්ල ද්‍රාවණයෙහි pH සඳහා ප්‍රකාශනයක් ලියන්න.

(iv) ඉහත (i) සහ (iii) කොටස්වල ලබාගත් පිළිතුරු භාවිත කර, අම්ල ද්‍රාවණ දෙකෙහි pH අගයවල වෙනස pH ඒකක 0.5 ක් බව පෙන්වන්න.

(v) ඉහත (i) කොටසෙහි අම්ල ද්‍රාවණයෙන් $220.0\ cm^3$ ක් සහ සාන්ද්‍රණය $c\ mol\ dm^{-3}$ වන NaOH ද්‍රාවණයකින් $20.0\ cm^3$ ක් මිශ්‍ර කර සාදා ගන්නා ද්‍රාවණයේ pH ගණනය කරන්න.

*(ලකුණු 7.5 යි.)*

(*b*) (i) 25 °C දී, $BaSO_4$ හි ද්‍රාව්‍යතා ගුණිතය $1.0 \times 10^{-10}\ mol^2\ dm^{-6}$ වේ. මෙම උෂ්ණත්වයේදී ජලීය සංතෘප්ත $BaSO_4$ ද්‍රාවණයක $Ba^{2+}$ සාන්ද්‍රණය ගණනය කරන්න.

(ii) 25 °C දී, ඉහත (i) කොටසෙහි ද්‍රාවණයේ $Ba^{2+}$ සාන්ද්‍රණය හරි අඩක් බවට පත්කිරීම සඳහා එහි $1.0\ dm^3$ කට එක් කළ යුතු සංශුද්ධ ඝන $Na_2SO_4$ ස්කන්ධය ගණනය කරන්න. (O = 16, Na = 23, S = 32)
මෙම ගණනය කිරීමේදී ඔබ විසින් කරන ලද උපකල්පන ඇතොත් ඒවා ප්‍රකාශ කරන්න.

(iii) 25 °C දී, $PbSO_4$ හි ද්‍රාව්‍යතා ගුණිතය $1.6 \times 10^{-8}\ mol^2\ dm^{-6}$ වේ. මෙම උෂ්ණත්වයේදී, $BaSO_4$ සහ සහ $PbSO_4$ යන දෙකෙන්ම සංතෘප්ත වූ ජලීය ද්‍රාවණයක $Ba^{2+}$ සහ $Pb^{2+}$ සාන්ද්‍රණ වෙන් වෙන්ව ගණනය කරන්න.

*(ලකුණු 7.5 යි.)*

[ දහවෙනි පිටුව බලන්න.

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 9

53934

7. (*a*) ග්‍රිනාඩ් ප්‍රතිකාරකය සාදනු ලබන්නේ ඇල්කයිල් හෝ ඒරයිල් හේලයිඩ, වියළි ඊතර් මාධ්‍යයේදී Mg සමග ප්‍රතික්‍රියා කිරීමෙනි. නමුත් පහත සඳහන් ප්‍රතික්‍රියාව ආධාරයෙන්, දී ඇති ග්‍රිනාඩ් ප්‍රතිකාරකය පිළියෙල කළ **නොහැක්කේ** මන්දැයි පැහැදිලි කරන්න.

$$HOCH_2CH_2CH_2Br \xrightarrow{Mg/\text{වියළි ඊතර්}} HOCH_2CH_2CH_2MgBr$$

(ලකුණු 2.0 යි.)

(*b*) $FeCl_3$ ඇති විටදී බෙන්සීන්හි ක්ලෝරොනීකරණය සඳහා යාන්ත්‍රණයක් දෙන්න. (ලකුණු 3.0 යි.)

(*c*) ලැයිස්තුවේ දී ඇති රසායන ද්‍රව්‍ය **පමණක්** භාවිතකරමින් ඔබ පහත සඳහන් පරිවර්තනය සිදුකරන්නේ කෙසේදැයි පෙන්වන්න.

$$(CH_3)_2C=CH_2 \longrightarrow (CH_3)_3C-\overset{\overset{\displaystyle O}{\|}}{C}-OC(CH_3)_3$$

| රසායන ද්‍රව්‍ය ලැයිස්තුව |
| --- |
| සාන්ද්‍ර $H_2SO_4$, තනුක $H_2SO_4$, $PCl_5$, |
| Mg, ඊතර්, HCHO, $K_2Cr_2O_7$ |

(ලකුණු 5.0 යි.)

(*d*) ආරම්භක කාබනික ද්‍රව්‍යය ලෙස ප්‍රොපනැල් **පමණක්** භාවිතකර පහත සඳහන් සංයෝගය සාදන්නේ කෙලෙසදැයි පෙන්වන්න.

$$CH_3-CH_2-\overset{\overset{\displaystyle O}{\|}}{C}-NH-CH_2-CH_2-CH_3$$

(ලකුණු 5.0 යි.)

www.pastpaperlk.com

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 10
[එකොළොස්වෙනි පිටුව බලන්න.

## C කොටස - රචනා

ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට **ලකුණු 15** බැගින් ලැබේ.)

**8.** (*a*) (i) ඝන මිශ්‍රණයක පහත දැක්වෙන ඒවායින් **දෙකක්** පමණක් අඩංගු වේ.

$Ba(NO_3)_2$ $Zn(NO_3)_2$ $AgNO_3$ $CaCO_3$ $NaOH$

ඒවා හඳුනාගැනීම සඳහා කරන ලද පරීක්ෂණ, නිරීක්ෂණ ද සමග පහත දැක්වේ:

| පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|
| 1. මිශ්‍රණයට ජලය එකතුකරන ලදී. | පැහැදිලි ද්‍රාවණයක් දෙමින් මිශ්‍රණය ද්‍රවණය විය. |
| 2. ඉහත 1 න් ලබාගත් ජලීය ද්‍රාවණයෙහි කොටසකට පිනෝල්ප්තලීන් බිංදු කිහිපයක් එක් කරන ලදී. | පැහැදිලි අවර්ණ ද්‍රාවණය රෝස පැහැයට හැරුණි. |
| 3. ඉහත 1 න් ලබාගත් ජලීය ද්‍රාවණයෙහි තවත් කොටසකට තනුක HCl ක්‍රමයෙන් එක් කරන ලදී. | සුදු අවක්ෂේපයක් සෑදුණි. තවදුරටත් අම්ලය එක් කිරීමේදී එය ද්‍රවණය විය. |

හේතු දක්වමින්, මිශ්‍රණයෙහි අඩංගු සංයෝග **දෙක** හඳුනාගන්න.

(ii) පහත රූපයේ **A** සිට **I** තෙක් සංයෝගවල **සූත්‍ර** ලියන්න. (**තුලිත රසායනික සමීකරණ සහ හේතු දැක්වීම අවශ්‍ය නොවේ.**)

එහි ඝන, අවක්ෂේප, ද්‍රාවණ හා වායු නිරූපණය කිරීමට පහත දැක්වෙන සංකේත භාවිත කෙරේ.







(*ලකුණු 7.0 යි.*)

[ දොළොස්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com

(*b*) (i) $3d$ ගොනුවේ මූලද්‍රව්‍යයක් වන **M** , $M^{n+}$ අයනයක් සාදයි. එම අයනය තනුක $H_2SO_4$ මාධ්‍යයේදී $MnO_4^-$ මගින් $MO_2^+$ අයනයට ඔක්සිකරණය කළ හැකි ය. පරීක්ෂණයකදී, $M^{n+}$ $5.00 \times 10^{-3}$ mol ක් $MO_2^+$ බවට ඔක්සිකරණය කිරීම සඳහා $0.100 \text{ mol dm}^{-3}$ $KMnO_4$ ද්‍රාවණ $30.0 \text{ cm}^3$ ක් අවශ්‍ය විය. මෙම දත්ත භාවිත කර *n* හි අගය ගණනය කරන්න.

(ii) Cu අඩංගු **Z** මිශ්‍ර ලෝහයෙහි ඇති Cu ප්‍රතිශතය නිර්ණය කිරීම සඳහා පහත දක්වෙන I හා II ක්‍රියාපිළිවෙළ අනුගමනය කරන ලදී.

ක්‍රියාපිළිවෙළ:

I. **Z** මිශ්‍රලෝහයේ 2.80 g ක නියැදියක් තනුක $H_2SO_4$ ද්‍රාවණ $500.0 \text{ cm}^3$ ක ද්‍රවණය කරන ලදී. මෙම ද්‍රාවණයෙන් $25.0 \text{ cm}^3$ කට වැඩිපුර KI එක් කිරීමෙන් CuI සුදු අවක්ෂේපය සහ $I_2$ ප්‍රමාණයක් ඵල වශයෙන් ලැබුණි. නිදහස් වූ $I_2$, දර්ශකය ලෙස පිෂ්ටය භාවිත කරමින්, $Na_2S_2O_3$ ද්‍රාවණය සමඟ අනුමාපනය කරන ලදී. මේ සඳහා අවශ්‍ය වූ $Na_2S_2O_3$ ද්‍රාවණ පරිමාව $30.0 \text{ cm}^3$ විය.

II. ආශ්‍රැත ජලය $500.0 \text{ cm}^3$ ක $K_2Cr_2O_7$ 1.18 g ක් ද්‍රවණය කිරීමෙන් පිළියෙල කරගත් ද්‍රාවණයේ $25.0 \text{ cm}^3$ කට තනුක $H_2SO_4$ $20 \text{ cm}^3$ ක් සහ වැඩිපුර KI එක් කරන ලදී. දර්ශකය ලෙස පිෂ්ටය භාවිත කර, නිදහස් වූ $I_2$ ඉහත පියවර I හි භාවිත කළ $Na_2S_2O_3$ ද්‍රාවණය සමඟ අනුමාපනය කරන ලදී. මේ සඳහා අවශ්‍ය වූ $Na_2S_2O_3$ පරිමාව $24.0 \text{ cm}^3$ විය.

1. ක්‍රියාපිළිවෙළ I සහ II හි සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න.
2. **Z** මිශ්‍ර ලෝහයෙහි ඇති Cu ප්‍රතිශතය නිර්ණය කරන්න.
3. ක්‍රියාපිළිවෙළ I සහ II හි අන්ත ලක්ෂ්‍යවලදී නිරීක්ෂණය කිරීමට ලැබෙන වර්ණ විපර්යාස දක්වන්න.
   (O = 16, K = 39, Cr = 52, Cu = 63.5)

**(ලකුණු 8.0 යි.)**

**9.** (*a*) (i) ඩවුන් කෝෂය භාවිතයෙන් සෝඩියම් නිෂ්පාදනය කිරීම පදනම් කරගනිමින් පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. සෝඩියම් නිෂ්පාදනය කිරීමට භාවිත කෙරෙන ආරම්භක ද්‍රව්‍යය නම් කරන්න.

II. විද්‍යුත් විච්ඡේදනයට පෙර ආරම්භක ද්‍රව්‍යයෙහි ද්‍රවාංකය පහත දැමීම සඳහා යම් ද්‍රව්‍යයක් එක් කරනු ලැබේ. එම ද්‍රව්‍යය හඳුනාගන්න.

III. විද්‍යුත් විච්ඡේද්‍ය කෝෂය ක්‍රියාකරන දළ උෂ්ණත්වය සඳහන් කරන්න.

IV. ඩවුන් කෝෂයෙහි ඇනෝඩය සහ කැතෝඩය හඳුනාගන්න.

V. ඇනෝඩයේදී සහ කැතෝඩයේදී සිදුවන අර්ධ කෝෂ ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

VI. ඇනෝඩය සහ කැතෝඩය වානේ දැලකින් (steel gauze) වෙන් කිරීම අවශ්‍ය වන්නේ ඇයි?

VII. ඇනෝඩය සහ කැතෝඩය වෙන් කිරීමට අමතරව නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ගත යුතු වැදගත් ආරක්ෂාකාරී පියවරක් දක්වන්න.

VIII. පහත දක්වෙන ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
"සෝඩියම් නිෂ්පාදනයේ දී අඩු ධාරාවක් සහ වැඩි විභවයක් භාවිත කෙරෙයි."

IX. මෙම ක්‍රමයේ දී සෝඩියම් ලබා ගැනෙන භෞතික අවස්ථාව දෙන්න.

X. සෝඩියම්හි භාවිත **දෙකක්** සහ ඇනෝඩයේදී ලබා ගන්නා ඵලයෙහි **එක්** භාවිතයක් දෙන්න.

(ii) සබන් නිෂ්පාදනයට අදාළ පියවර හතර **කෙටියෙන්** විස්තර කරන්න.

**(ලකුණු 7.5 යි.)**



< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 12

(*b*) (i) පහත දී ඇති I සිට V තෙක් ප්‍රකාශ සලකන්න:

I. පෘථිවිය මත ජීවීන්ට උපකාර වන ස්වාභාවික ක්‍රියාවලි
II. වායුගෝලීය වායු සමඟ සූර්ය විකිරණවල අන්තර්ක්‍රියා නිසා සිදුවන අහිතකර ක්‍රියාවලි
III. පාරිසරික ගැටලුවලට මූලවන හානිකර වායු ලබාදිය හැකි ක්‍රියාවලි
IV. සමහර කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන පරිසර හානි
V. අම්ල වැසි හේතුවෙන් සිදුවන පරිසර හානි

I සිට V තෙක් එක් එක් ප්‍රකාශය සඳහා **වඩාත් ගැළපෙන වරණ තුන බැගින්** පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියන්න. (ඔබේ උත්තර පත්‍රයෙහි I සිට V තෙක් ප්‍රකාශවල අංක ලියා, ඒ එක එකක් ඉදිරියෙන් අදාළ වරණ තුනෙහි සංකේත, **A, B, C,** ...... ආදී වශයෙන් ලියා දක්වන්න. එක් වරණයක් එක් වරකට වැඩියෙන් භාවිත කළ හැකිය.)

A - ප්‍රභාසංස්ලේෂණය
B - ලෝහ හෝ හුනුගල්වලින් සෑදූ නිර්මාණවල විඛාදනය
C - ගෝලීය උණුසුම්කරණය
D - ඕසෝන් ස්තරය මගින් UV විකිරණ අවශෝෂණය
E - ගිනිකඳු පිපිරීම
F - මණ්ඩි ලෙස ඇති බැර ලෝහ ලවණ දියවීම
G - හරිතාගාර ආවරණය
H - ඕසෝන් ස්තරය ක්ෂයවීම
I - කොරල් පර විනාශය
J - පොසිල ඉන්ධන දහනය
K - ප්‍රකාශ රසායනික ධූමිකාව (smog)
L - භූගත ජලය දූෂණය වීම
M - ලෝහ පිරිපහදුව
N - ජලාශවල ඇල්ගී ශීඝ්‍ර ලෙස වර්ධනය (සුපෝෂණය)

(ii) ගල්අඟුරු බලාගාරයකින් අම්ල වැසි සඳහා ලැබෙන දායකත්වය, ආම්ලික වායු විමෝචනය පාලනය කිරීම මගින් අඩු කළ හැකිය. දේශීය වශයෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය යොදගනිමින්, ආම්ලික විමෝචන පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමයක් යෝජනා කරන්න. ඔබේ පිළිතුර සනාථ කිරීම සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(iii) නොයෙකුත් ක්‍රියාවලි හරහා වායුගෝලයට නිදහස් වන NO සහ $SO_2$ යන ආම්ලික වායු, වායුගෝලයෙහි පිළිවෙළින් $HNO_3$ සහ $H_2SO_4$ අම්ල සෑදීමට හේතු වේ. මෙම අම්ල සෑදීම සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

(iv) පහත දී ඇති සංයෝග සලකන්න:

$CH_3(CH_2)_4CH_3$ $CFCl_3$ $CF_2Cl_2$ $N_2$ NO

මේවා අතුරෙන්,

I. ගෝලීය උණුසුම්කරණය
II. ඕසෝන් ස්තරය ක්ෂයවීම

සඳහා දායකවන සංයෝග හඳුනාගන්න.

(v) ඕසෝන් ස්තරයෙහි ඕසෝන් සෑදීමත් විනාශවීමත් ස්වාභාවිකව සිදුවේ. ඕසෝන් ස්තර කලාපයට මුක්ත ඛණ්ඩක සාදන සංයෝග ඇතුළුවීමෙන් ද උත්ප්‍රේරිතව ඕසෝන් හානි වේ. ඕසෝන් ස්තරයෙහි, පහත දක්වෙන ක්‍රියාවලි සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

I. ස්වාභාවිකව ඕසෝන් සෑදීම සහ විනාශවීම
II. ඛණ්ඩක සෑදීම
III. ඕසෝන්වල උත්ප්‍රේරිත විනාශවීම

(ලකුණු 7.5 යි.)

www.pastpaperlk.com

**10.** (*a*) ෆ්ලුවොරීන්වල රසායනය සහ අනෙක් හැලජනවල රසායනය අතර වැදගත් වෙනස්කම් **හතරක්** දෙන්න.

**(ලකුණු 2.5 යි.)**

(*b*) සමහර අවස්ථාවලදී සෝඩියම් සල්ෆයිට් ($Na_2SO_3$), පරිරක්ෂකයක් (preservative) ලෙස සොසේජ් මස්වලට (sausage meat) එකතු කරනු ලැබේ. මස් නියැදියක අඩංගු $Na_2SO_3$ පරිරක්ෂක ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාපිළිවෙළ යොදාගන්නා ලදී.

www.pastpaperlk.com

පියවර 1 : මස් කිලෝග්‍රෑමයක් (1.00 kg) තනුක HCl වැඩිපුර ප්‍රමාණයක් සමඟ තටවන ලදී.

පියවර 2 : පිටවූ වායුව, $0.050 \text{ mol dm}^{-3}$ $I_2$ ද්‍රාවණ වැඩිපුර ප්‍රමාණයක සම්පූර්ණයෙන්ම අවශෝෂණය කරන ලදී. භාවිත කළ $I_2$ ද්‍රාවණයේ පරිමාව $40.0 \text{ cm}^3$ කි.

පියවර 3 : පියවර 2 හිදී ලැබුණු ද්‍රාවණය, දර්ශකය ලෙස පිෂ්ටය යොදාගනිමින්, $0.100 \text{ mol dm}^{-3}$ $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමඟ අනුමාපනය කරන ලදී. මේ සඳහා අවශ්‍ය වූ $Na_2S_2O_3$ ද්‍රාවණයේ පරිමාව $26.0 \text{ cm}^3$ කි.
(O = 16, Na = 23, S = 32)

(i) ඉහත ක්‍රියාපිළිවෙළෙහි අඩංගු වූ පියවර **තුන** සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

www.pastpaperlk.com

(ii) මස් නියැදියෙහි 1.00 kg ක ඇති $Na_2SO_3$ ප්‍රමාණය මවුලවලින් ගණනය කරන්න.

(iii) මස් නියැදිවල ඇති පරිරක්ෂක ප්‍රමාණය, සාමාන්‍යයෙන්, මිලියනයක ඇති කොටස් (ppm) ලෙස ප්‍රකාශ කරනු ලැබේ. (ඒ අනුව 1 ppm = මස් $10^6$ g ක ඇති $Na_2SO_3$ 1 g ක්)
ඉහත (ii) කොටසෙහි නිර්ණය කරන ලද $Na_2SO_3$ ප්‍රමාණය ppm වලින් ප්‍රකාශ කරන්න.

(iv) අනුමාපනයේ අන්ත ලක්ෂ්‍යයේදී වර්ණ විපර්යාසය දක්වන්න.

**(ලකුණු 5.0 යි.)**

www.pastpaperlk.com

(*c*) නියත උෂ්ණත්වයකදී පහත දක්වෙන ප්‍රතික්‍රියාවෙහි චාලකය හැදෑරීම සඳහා ශිෂ්‍යයෙක් පරීක්ෂණ තුනක් සිදු කළේය.

$$2I^-(aq) + S_2O_8^{2-}(aq) \longrightarrow I_2(aq) + 2SO_4^{2-}(aq)$$

(i) පළමුවන පරීක්ෂණයේදී, $0.160 \text{ mol dm}^{-3}$ $I^-(aq)$ ද්‍රාවණ $500 \text{ cm}^3$ ක් සහ $0.040 \text{ mol dm}^{-3}$ $S_2O_8^{2-}(aq)$ ද්‍රාවණ $500 \text{ cm}^3$ ක් මිශ්‍ර කර ඉහත ප්‍රතික්‍රියාව සිදුවීමට ඉඩහරින ලදී. ආරම්භක තත්පර 5 ක කාල පරිච්ඡේදය අවසානයේදී $I_2$ මවුල $2.8 \times 10^{-5}$ ක් සෑදී ඇති බව සොයාගන්නා ලදී.

I. $I_2(aq)$ සෑදීමේ ශීඝ්‍රතාව ගණනය කරන්න.

II. $I^-(aq)$ වැයවීමේ ශීඝ්‍රතාව ගණනය කරන්න.

www.pastpaperlk.com

III. $S_2O_8^{2-}(aq)$ වැයවීමේ ශීඝ්‍රතාව ගණනය කරන්න.

(ii) දෙවන පරීක්ෂණයේදී, $0.320 \text{ mol dm}^{-3}$ $I^-(aq)$ ද්‍රාවණ $500 \text{ cm}^3$ ක් සහ $0.040 \text{ mol dm}^{-3}$ $S_2O_8^{2-}(aq)$ ද්‍රාවණ $500 \text{ cm}^3$ ක් මිශ්‍ර කරන ලදී. එවිට ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව $1.12 \times 10^{-5} \text{ mol dm}^{-3} \text{ s}^{-1}$ බව නිර්ණය කරන ලදී.

ඉහත (i) සහ (ii) කොටස්වල දී ඇති තොරතුරු භාවිත කරමින්, $I^-(aq)$ ට සාපේක්ෂව ප්‍රතික්‍රියාවෙහි පෙළ ගණනය කරන්න.

www.pastpaperlk.com

(iii) $S_2O_8^{2-}(aq)$ හි සාන්ද්‍රණය වෙනස්කිරීමෙන් සිදුකරන ලද අවසාන පරීක්ෂණයේදී, $S_2O_8^{2-}(aq)$ ට සාපේක්ෂව ප්‍රතික්‍රියාවෙහි පෙළ 1 බව නිර්ණය කරන ලදී.

I. මෙම ප්‍රතික්‍රියාව සඳහා වේග සමීකරණය (rate equation) ලියන්න.

II. ඉහත (ii) කොටසෙහි ද්‍රාවණ දෙකෙහිම පරිමා ආසුත ජලය එක් කිරීමෙන් දෙගුණ කර ඉන්පසු එම ද්‍රාවණ මිශ්‍ර කළ විට, ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව ගණනය කරන්න.

(iv) I. පළමු පෙළ ප්‍රතික්‍රියාවක අර්ධජීව කාලය යන්නෙන් අදහස් කෙරෙනුයේ කුමක් ද?

II. $I^-(aq)$ සාන්ද්‍රණය නියතව තබා ඇති විට, ඉහත ප්‍රතික්‍රියාවෙහි අර්ධජීව කාලය ආරම්භක $S_2O_8^{2-}(aq)$ සාන්ද්‍රණයෙන් ස්වායත්ත ය. ප්‍රස්තාරික නිරූපණයක් ආධාරයෙන් මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.

www.pastpaperlk.com

**(ලකුණු 7.5 යි.)**

* * *

www.pastpaperlk.com



< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 14

www.pastpaperlk.com

## ආවර්තිතා වගුව

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Uun | 111 Uuu | 112 Uub | 113 Uut | ... | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

www.pastpaperlk.com
www.pastpaperlk.com
www.pastpaperlk.com
www.pastpaperlk.com
www.pastpaperlk.com
www.pastpaperlk.com

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 15